දිවි අහිමි කිරීම් පිළිබඳව පළ වන පුවත් වාර්තාවන් ඔස්සේ පවා වක්රාකාරයෙන් තවත් දිවි අහිමි කරගැනීම් වලට උත්ප්රේරණයක් සැපයීම සිදුවිය හැකි කරුණකි. විශේෂයෙන්ම ඝාතනයක් සහ දිවි අහිමි කරගැනීමක් සිදුවී ඇති විටකදී, එවැනි පුවතකට විශේෂ අවධානයක් ලැබීමට හැක. එනිසා, දිවි අහිමි කරගැනීම් සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී ඒ සඳහා හඳුන්වා දී ඇති ආචාර ධාර්මික නිර්දේශයන්ට අනුකූල වීම අත්යාවශ්ය වේ.
උදාහරණයක් ලෙසින් මෙම මව්බිම (12/03) පුවත් වාර්තාව ගනිමු. එහි දිවි අහිමි කරගැනීම් වාර්තාකරණය සඳහා හඳුන්වා දී ඇති ආචාර ධර්මයන් කඩ කිරීම් කිහිපයක්ම තිබේ.

දිවි අහිමි කරගැනීමක් පසුපස සංකීර්ණ කරුණු ගණනාවක් තිබිය හැක. එනිසා, දිවි අහිමි කරගැනීමක් වාර්තා කිරීමේදී ඊට හේතුවූ කරුණු සරලව නොදැක්විය යුතු බව පැවසේ. දිවි අහිමි කරගත් ආකාරය පළ කිරීම සහ දිවි අහිමි කරගත් ආකාරය දීර්ඝ වශයෙන් විස්තර කිරීම නොකළ යුත්තේ තවෙකෙකු එය අනුකරණය කිරීමට හැකියාවක් ඇති බැවිනි.
එසේම දිවි අහිමි කරගැනීම් සම්බන්ධයෙන් වන පුවත් වාර්තාවන්, ලිපි සමගින් උපකාරක අංක සඳහන් කිරීම අත්යාවශ්ය භාවිතාවකි. දිවි අහිමි කරගැනීමට නැඹුරුවක් ඇති අයෙකුගේ ජීවිතයක් බේරාගැනීමට එය ඉවහල් විය හැක.

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්රී ලංකා සුමිත්රයෝ -0112696666
*ජාතික මානසික සෞඛ්ය ආයතනය-1926
මූලාශ්ර:
https://media.samaritans.org/.../Media_Guidelines_FINAL...
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...
https://accountablejournalism.org/.../australia-standards...

**#MediaEthicsSL #lka #SinhalaNews#Mawbima**